Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව 3.0 - රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

නිපුණතා මට්ටම 3.2 - රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.

රජයක් පහත දැක්වෙන ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරයි.

1.**ආර්ථික වර්ධනය හා සංවර්ධනය** - නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදු වන අතර ඊට අමතරව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි.

2.**පූර්ණ සේවා නියුක්තිය** - ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන්ම ආර්ථිකය සතු සියලුම නිශ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම.

3.**සාධාරණ ආදායම් ව්‍යාප්තිය** - රටක සමස්ත නිෂ්පාදිතය එරටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමානව බෙදා හැරීම.

4.**ආර්ථික ස්ථායිතාව** - ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායිතාවයි.

5.**යහපත් අන්තර්ජාතික වෙළෙඳාම** - විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

**අභ්‍යාස**

1.ආර්ථික ස්ථායිතාවයේ කොටස් දෙක නම් කර පැහැදිලි කරන්න.

2.රජයේ ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ.පැහැදිලි කරන්න.